## ඔබේ වයස 50 - 74 අතර නම්, බඩවැලේ පිළිකා පරීක්ෂණ කට්ටලයක් තැපැල් මගින් ඔස්ට්‍රේලියානු රජයෙන් ඔබට ලැබුණු විට:

# එම පරීක්ෂාව සිදුකරන්න.

### ඔබේ වයස 50 - 74 අතර නම් සහ නොමිලේ දෙන කට්ටලයක් තැපෑලෙන් ඔබට නොලැබුනේ නම්

බඩවැලේ පිළිකා නිර්ණය කිරීමේ ජාතික වැඩ වැඩසටහන 1800 118 868 ඔස්සේ අමතා නොමිලේ දෙන කට්ටලයක් ඔබට ලැබෙන්නේ කවදාදැයි විමසන්න. නොඑසේනම් පරීක්ෂණ කට්ටලයක් ලබා ගන්නේ කෙසේදැයි ඔබේ වෛද්‍යවරයාගෙන් විමසන්න.

### ඔබට රෝග ලක්ෂණයක් තිබේදැයි හෝ බඩවැලේ පිළිකා පිළිබඳ ප්‍රබල පවුලේ ඉතිහාසයක් ඇත්දැයි දැනීමක් නැතිද?

ඔබේ වෛද්‍යවරයා හමුවන්න, නැත්නම් 13 11 20 ඔස්සේ Cancer Council Victoria අමතන්න, එසේත් නැත්නම් නරඹන්න www.cancervic.org.au වෙබ් අඩවිය.

පිළිකා පිළිබඳ තොරතුරු සහ සහාය සඳහා Cancer Council Victoria **13 11 20** හෝ **www.cancervic.org.au** ඔස්සේ සම්බන්ධ කරගන්න.

පිළිකා පිළිබඳ තොරතුරු ඔබේ භාෂාවෙන් දැනගැනීමට **13 14 50** ට කතාකර Cancer Council Victoria අමතන ලෙස පවසන්න.

*මෙම පත්‍රිකාවේ යොදා ඇති රූප වල හිමිකරුවන් වන පහත සඳහන් අය හට Cancer Council Victoria හි කෘතඥතාවය හිමි වේ.*
*රූ සටහන්: Julie Haysom Artwork*
*(විස්තර) Dixon Patten Jnr – Yorta Yorta and Gunnai*
*www.cancervic.org.au/dixon-patten*

*සිය පත්‍රිකාව් වික්ටෝරියාව ට සුදුසු ලෙස සකස්කර ගැනීමට අවසරය දුන් WA Health වෙතද අපගේ ස්තුතිය හිමි වේ.*
2018 ජූලි

Sinhalese

Cancer Council

# බඩවැලේ පිළිකා කල් ඇතිව හඳුනා ගැනීමෙන් ඔබේ ජීවිතය ආරක්ෂා කරගත හැක.

ඔබ සුවෙන් සිටින සේ හැඟුනත්, රෝග ලක්ෂණ නොමැති වුණත්, නොමිලේ කළ හැකි මෙම පරීක්ෂාව සිදු කර බඩවැලේ පිළිකාවක් ඇත්දැයි සොයා බැලිය යුතුයි.



## 1 ඔබේ නම, උපන් දිනය සහ සාම්පලය ගත් දිනය රැස් කිරීමේ එක් නලයක් මත ඇති ලේබලයේ ලියන්න.



## 2 පළමු සාම්පලය එකතු කර ගැනීමට සූදානම් වන්න.

මුත්‍රාකර වැසිකිළිය සෝදාහරින්න.
කඩදාසි වැසිකිළි වැස්ම වැසිකිළි පෝච්චිය තුළ එලන්න (කඩදාසිය තෙමුණාට කමක් නැහැ, එය සෝදා හැරිය හැකියි).




## 3 පළමු සාම්පලය රැස් කර ගන්න.



කඩදාසිය මතට මලපහ කරන්න.



නළය විවෘතකර කූරේ තුඩ මල තුලින් ඇදගෙන යන්න.
ඉතා කුඩා සාම්පලයක් ලබා ගන්න. සහල් ඇටයකට වඩා කුඩා වීම ප්‍රමාණවත්ය

## 4 පළමු සාම්පලය ගබඩා කර තබන්න.

රැස්කිරීමේ නළය තුලට කූර ආපසු දමා පියන තදකර වසන්න. නළය ඉහලට පහලට සොලවන්න.

පළමුව එකතු කළ සාම්පලය සහිත නළය ශීතකරණයේ තබන්න.

අධිශීතකරණය නොකරන්න.



## 5 දෙවෙනි සාම්පලය රැස් කරගැනීමට ඔබ ඊළඟට මලපහ කරන විට අනිත් කූර පාවිච්චි කරන්න.

දෙවෙනි සාම්පලය රුස්කරගැනීමට නැවත වරක් පියවර 1 සිට 4 දක්වා සිදු කරන්න.
දෙවැනි සාම්පලය හැකි ඉක්මණින් එකතු කර ගත යුතු වේ.

## 6 සහභාගී වන්නාගේ තොරතුරු ෆෝරමය පුරවන්න. නැතිනම් එය පිරවීම සඳහා උදව් ලබා ගන්න.

සහභාගී වන්නාගේ තොරතුරු ෆෝරමය සහ රැස් කිරීමේ නළ දෙක (සිප් ලොක් බෑගයෙහි බහා අවුරන ලද) ආපසු යැවීම සඳහා මුදල් ගෙවා ඇති ලිපි කවරයට දමන්න. ලිපි කවරය තැපැල් කරන්න.



## ඔබේ ප්‍රතිඵලය සති කිහිපයකින් ඔබ වෙත ලැබෙනු ඇත.

**රුධිරය හමුවිය.**
වැඩිදුර පරීක්ෂණ සඳහා ඔබේ වෛද්‍ය වරයා හමුවන්න.
ඔබට පිළිකාවක් ඇතැයි මෙයින් අදහස් නොකෙරේ.

**රුධිරය හමු නොවුණි.**
නැවත වසර දෙකකින් නිවසේ දී කරන බඩවැලේ පිළිකා පරීක්ෂණය කරන්න.